**ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශිර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ

ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරුවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත්, වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.1.3 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.5 |
| | | 3. ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම. | 2.9 |

| | | | |
|---|---|---|---|
| | | 4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1.4 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස් වලට අනුකූලව කරනු ලබන බව. | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2<br>2.2 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලසුම් කිරීම

**තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධිත අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා සියලු පාර්ශවයන් නියෝජනය වන පරිදි දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

## 2.1.2 කාර්යභාරයන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ප්‍රාදේශීය ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම

ප්‍රාදේශීය ක්‍රීඩාංගන සංවර්ධනය යටතේ ග්‍රාමීය ක්‍රීඩාංගන 200 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 564 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 වර්ෂයේදී ග්‍රාමීය ක්‍රීඩාංගන 54 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු. මිලියන 343 ක් වැය කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩාංගන 26 ක වැඩ අවසන් කර තිබුණු අතර ක්‍රීඩාංගන 28 ක වැඩ අවසන් කර නොතිබුණි. මේ අනුව ක්‍රීඩාංගන 146 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### (ආ) පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම

පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම යටතේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 13 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 5 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 1000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර භාණ්ඩාගාරය විසින් රු.මිලියන 300 ක අතිරේක ප්‍රතිපාදනද ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ක්‍රීඩා සංකිර්ණ 13 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 07 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 941 ක් වැය කර තිබුණි. එයින් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 5 ක් සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 3 ක වැඩ අවසන් කර තිබුණු අතර ඉතිරි දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 8 ක සහ පළාත් ක්‍රීඩා සංකීර්ණ 4 ක වැඩ අවසන් කර නොතිබුණි.

## 2.1.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.1.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 663.35 ක ප්‍රතිපාදන මත ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු ව්‍යාපෘති 24 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 163.25 ක් වැයකර තිබුණු අතර රු.මිලියන 500.1 ක් එනම් වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 75 ක් ම උපයෝජනය නොකර ඉතිරිව තිබුණි. මෙම ව්‍යාපෘති තුළ 2018 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණු ව්‍යාපෘති 23 ක් පැවතීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

## 2.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ අංශ 03 ක හා දිස්ත්‍රික් ක්‍රීඩා කාර්යාල 11 ක භාණ්ඩ සමීක්ෂණ 2018 අගෝස්තු 27 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ii) 2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 752 (4) සහ 770 පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය වත්කම්**

2016 දෙසැම්බර් 23 වන දින ගබඩාවට භාර ගෙන තිබූ රු.12,995,000 ක් වටිනා බර ඉසිලීමේ ඉලෙක්ට්‍රොනික් විනිශ්වය සංඥා පද්ධති උපකරණය 2018 සැප්තැම්බර් 14 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශ්වයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුවට අයත් මොටර් කාර් රථයක් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම අයත්ව තිබුණු ආයතනය |
| --- | --- |
| බෙලිඅත්ත ක්‍රීඩාංගනය | බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව |
| කාර් රථ 2 ක් | ක්‍රීඩා අමාත්‍යාංශය |
| ජීප් රථයක් | ක්‍රීඩා අමාත්‍යාංශය |

**2.3 බැඳීම් හා බැරකම්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපාදන ඉක්මවූ බැරකම්**

----------------------------

මූලධන වැය විෂයයන් 05 ක් සලසා තිබුණු රු.මිලියන 135.25 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 9.95 ක බැරකම් නිරීක්ෂණය විය.

**2.4 අනාර්ථික ගනුදෙනු**

------------------------

ඉන්දියාවේ ගුහාටි හි 2016 පෙබරවාරි මස පැවති 12 වන දකුණු ආසියානු තරඟාවලිය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත ලබා දී ඇති මුදලින් ඉතිරි වූ රු. 6,878,916 ක් 2018 සැප්තැම්බර් 15 දින වන විටත් දෙපාර්තමේන්තුවට ලබා දී නොතිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

----------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 498 | 304 | 194 | 39 |
| | මූලධන | 1,457 | 1,260 | 197 | 13 |
| | **එකතුව** | **1,955** | **1,564** | **391** | **20** |
| 2014 | පුනරාවර්තන | 511 | 411 | 100 | 19 |
| | මූලධන | 1,743 | 1,133 | 610 | 35 |
| | **එකතුව** | **2,254** | **1,544** | **710** | **31** |
| 2015 | පුනරාවර්තන | 587 | 535 | 52 | 9 |
| | මූලධන | 2,213 | 1,775 | 438 | 20 |
| | **එකතුව** | **2,800** | **2,310** | **490** | **17** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 727 | 707 | 20 | 3 |
| | මූලධන | 2,084 | 1,306 | 778 | 37 |
| | **එකතුව** | **2,811** | **2,013** | **798** | **28** |
| 2017 | පුනරාවර්තන | 1,040 | 909 | 131 | 13 |
| | මූලධන | 2,345 | 1,577 | 768 | 33 |
| | **එකතුව** | **3,385** | **2,486** | **899** | **26** |

**(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

---

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ කාර්ය භාරයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා පහත සඳහන් ඌනතාවයන් සිදු වී තිබුණි.

(i) රු. මිලියන 3,385.89 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 899.05 ක් උපයෝජනය නොකර ඉතිරිව තිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26.5 ක් විය. මෙම ඉතිරි වූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 768.17 ක් මූලධන ප්‍රතිපාදන වූ අතර එය ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 22.7 ක් විය.

(ii) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 77 දක්වා අතර පරාසයක් ගෙන තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

---

**ගිණුම් සකස් කිරීමේ දෝෂ**

---

බැංකු සැසඳුමේ හඳුනානොගත් හර ලෙස දක්වා තිබූ 2016 වර්ෂයේ පැවති 12 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගී වූ නිලධාරීන්ට ගෙවන ලද අනියම් හා සංයුක්ත දීමනා රු.4,811,042 ක් සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන වැඩසටහනේ වෙනත් පුනරාවර්තන වැය විෂයයට හරකර තිබුණි.

**(ඇ) අස්ථානගත වවුචර්**

---

විසර්ජන ගිණුමේ DGSA-10 ආකෘතියේ අස්ථානගත වූ වවුචර් පිළිබඳ ප්‍රකාශයේ අස්ථානගත වවුචර් ''නැත'' යනුවෙන් වාර්තා කර තිබුණද ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී රු.7,386,902 ක් වටිනා ගෙවීම් වවුචර් 48 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 12 | 12 | 7 | 8 | 34 | 33 |

**හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට මියගිය, විශ්‍රාම ගිය හා සේවය අත්හැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.243,980 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂයන්ගෙන් රු.242,280 ක ශේෂයක් වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාලපරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.7 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 220 ක් වූ අතර වර්ෂ 2 ක් ඉක්ම වූ තැන්පතු 11 ක එකතුව වන රු.13,306,587 ක් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

**ගැලපුම් කළ යුතු ශේෂ**

ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුව විසින් ඍජු ගෙවීම් ලෙස දක්වා තිබුණු එකතුව රු.221,770 ක් වටිනා සටහන් 05 ක් සම්බන්ධයෙන් එහි නිවැරදිතාවය සොයා බලා අවශ්‍ය ගැලපීම් කිරීමට 2018 අප්‍රේල් 18 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි. |
| (iii) බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 211 | පවත්වා තිබුණ ද නිවැරදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි. |

## 2.10 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණ ද මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව මුදල් කටයුතු වලට අදාළ පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ඇතුළත් කාර්ය භාරයන් 12 කින් 07 ක් පමණක් ඉටුකර තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම්, ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම හා අලුත්වැඩියාව, ක්‍රීඩා කෞතුකාගාරය ඉදිකිරීම හා වත්කම් කළමනාකරණ යන ව්‍යාපෘතිවල විගණන කාර්යයන් ඉටු කර නොතිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 123 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.438,199 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 10 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 18 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 249 | 164 | 85 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 104 | 89 | 17 | 02 |
| | එකතුව | 391 | 281 | 112 | 02 |